**බදුල්ල, හාලි ඇළ සහ ඇල්ල සම්බන්ධ කිරීමේ ජල සම්පාදන ව්‍යාපෘතිය - 2015**

---

බදුල්ල, හාලි ඇළ සහ ඇල්ල සම්බන්ධ කිරීමේ ජල සම්පාදන ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ එක්සත් ජනපදයේ අපනයන/ ආනයන බැංකුව හා ශ්‍රී ලංකාවේ හැටන් නැෂනල් බැංකුව අතර එළඹි 2013 ජූලි 01 දිනැති අංක ඒ.පී. 086903 එක්ස්.එක්ස් හා 2013 නොවැම්බර් 06 දිනැති අංක 3294 දරන ණය ගිවිසුම් යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් වලට අනුව, වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාශය, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ ජල සම්පාදන පහසුකම් පුළුල් කිරීම හා ඉදිකිරීම මගින් සුරක්ෂිත පානීය ජලය සැපයීම හා එමගින් ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමට හා ප්‍රදේශයේ දුප්පත්කම අඩු කරලීමට දායක වීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය රු.මිලියන 11,809.51 කට සමාන එ.ජ.ඩො. මිලියන 91.37 ක් වූ අතර ඉන් රු. මිලියන 8,356.53 කට සමාන එ.ජ.ඩො.මිලියන 64.89 ක් එක්සත් රාජධානියේ අපනයන/ ආනයන බැංකුව විසින් සැපයීමට එකඟ වී තිබුණි. එයට අමතරව රු. මිලියන 1,213.98 කට සමාන එ.ජ.ඩො.මිලියන 9.26 ක් ශ්‍රී ලංකාවේ හැටන් නැෂනල් බැංකුව විසින් සැපයීමට එකඟ වී තිබුණි. ඉතිරි රු. මිලියන 2,239 කට සමාන එ.ජ.ඩො. මිලියන 17.22 ක් ශ්‍රී ලංකා රජය විසින් සැපයීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2012 දෙසැම්බරයේදී ආරම්භ කර තිබුණු අතර 2017 අගෝස්තු 31 අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල

සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව,

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් ණය ගිවිසුම් වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව මාගේ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 නොසැසඳුනු ශේෂ**

ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. මිලියන 2,973.46ක් වූ ආපසු ගැනීම් ඉල්ලුම්පත්‍ර මුදල් ලබා ගැනීමේ අරමුණින් 2015 දෙසැම්බර් 31 දින ණය සපයනු ලබන නියෝජිත ආයතනය වෙත ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුව ද විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව අදාල ආපසු ගැනීම් ඉල්ලුම් පත්‍රවල වටිනාකම රු. මිලියන 2,413.99 කි. ව්‍යාපෘතිය එම වෙනස සැසඳීමට ක්‍රියා මාර්ග ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

අරමුදල් මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත වෙන්කිරීම, සමාලෝචිත වර්ෂය තුළදී සහ 2015 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම් වල මූල්‍යායනය කිරීම සඳහා එකඟ වූ වටිනාකම | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ ප්‍රතිපාදනය | අරමුදල් උපයෝජනය 2015 වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දින දක්වා | |
|---|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන |
| එක්සත් ජනපදයේ අපනයන/ ආනයන බැංකුව | 64.89 | 8,356.53 | 1,293.62 | 9.54 | 1,293.62 | 22.43 | 2,974.65 |
| හැටන් නැෂනල් බැංකුව | 9.26 | 1,213.98 | - | - | - | 9.26 | 1,213.98 |
| ශ්‍රී.ලං.ර | 17.22 | 2,239.00 | 150.00 | 0.72 | 79.84 | 1.73 | 191.48 |
| **එකතුව** | **91.37** | **11,809.51** | **1,443.62** | **10.26** | **1,373.46** | **33.42** | **4,380.11** |

සැලසුම් කරන ලද කාලය තුල ව්‍යාපෘතියේ අරමුණු ළඟා කර ගැනීම සහතික කර ගැනීම සඳහා සකසන ලද විස්තරාත්මක සැලැස්මේ තිබූ දුර්වලතා නිසා ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර වසර 2ක් ගත වීමෙන් පසුව 2015 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 11,809.51ට සමාන එ.ජ.ඩො. මිලියන 91.37 ක් වූ මුළු වෙන් කිරීම් වලින් සියයට 36.57 ක් නියෝජනය වන රු. මිලියන 4,380.11 කට සමාන එ.ජ.ඩො. මිලියන 33.42ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමකින් තොරව ඉතිරි කාල සීමාව තුළ ශේෂය වූ එ.ජ.ඩො. මිලියන 57.95 උපයෝජනය කිරීමේ හැකියාව සැක සහිත විය.

### 3.2 භෞතික ප්‍රගතිය

--------------------

ලද තොරතුර අනුව කොන්ත්‍රාත් ගිවිසුම සමාප්තියකට ගෙන ඒම සඳහා කාලය ගත වූ බැවින් ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වූ කටයුතු ප්‍රමාද වී ආරම්භ කර තිබුණි. කොන්ත්‍රත්කරු, ජාතික ජලසම්පාදන හා ජල පවහන මණ්ඩලය සමග 2011 දෙසැම්බර් 25 දින එළඹි මුල් ණය ගිවිසුම සංශෝධනය කර 2014 ඔක්තෝබර් 24 දින නව ණය ගිවිසුමක් අත්සන් කරන ලදි. ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තා අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ ඉදිකිරීම් වැඩවල සමස්ත භෞතික ප්‍රගතිය සියයට 90ක්ව පැවතුණි.

### 3.3 මතභේදයට තුඩු දෙන කරුණු

-----------------------------------

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) මූල්‍යමය හා ක්‍රියාත්මක කිරීමේ අරමුණු සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා ශ්‍රී ලංකා රජය අතර අතුරු ණය ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි. එමනිසා අතුරු ණය මත පොලිය ගණනය කර මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

(ආ) ව්‍යාපෘතිය එහි පරිපාලන වැඩ සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් බඳවාගෙන තිබුණද, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය සඳහා පාරිශ්‍රමිකය ගණනය කර තිබුණු අතර ඒ සඳහා පොදුකාර්ය වලින් සියයට 20 ක් ව්‍යාපෘතියෙන් අය කරගෙන තිබුණි. ව්‍යාපෘතිය විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත 2015 දෙසැම්බර් 31 දක්වා එසේ ගෙවන ලද පොදු කාර්ය වියදම රු. මිලියන 4.53 ක් විය.

(ඇ) ලද තොරතුරු අනුව එකතුව රු. මිලියන 20.15ක් බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කායීාලයට වෙත ඉඩම් අත්පත් කර ගැනීමේ අරමුණින් ප්‍රේෂණය කර තිබුණි. කෙසේ වුවද අත්පත් කරගත් ඉඩම්වල අයිතිය 2015 දෙසැම්බර් 31 දින වන විටත් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත පවරා දී නොතිබුනි.

### 3.4 පරිබාහිර ගනුදෙනු

--------------------

ව්‍යාපෘතියේ අරමුණු හා ඍජු සම්බන්ධයක් නොමැති බදුල්ල ප්‍රදේශයේ මැදිරිය ප්‍රාදේශීය උපකාර මධ්‍යස්ථානයේ නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා එකතුව රු.මිලියන 3.49ක් වැය කර තිබූ බව නිරීක්ෂණය විය.